# තනතුරු පුරප්පාඩු

## උතුරු පළාත් සභාවේ පවතින ඉංජිනේරු (සිවිල්) අනුමත සේවක පුරප්පාඩු සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම - 2021

**01. පුරප්පාඩු සංඛ්‍යාව - 09**

**02. සුදුසුකම් :**

i. සාමාන්‍ය සුදුසුකම්
අයදුම්කරු ශ්‍රී ලංකා පුරවැසියකු විය යුතුයි.

ii. අධ්‍යාපන සුදුසුකම්
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද විශ්වවිද්‍යාලයකින් ලබාගත් ඉංජිනේරු (සිවිල්) විද්‍යාවේදී උපාධිය (BSc Engineering in Civil)

ඒ සමගම

ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් අනුමත කරන ලද අධ්‍යයනය සම්බන්ධයෙන් වූ සාමාජිකත්වය ලබා ගැනීමට සුදුසුකම් ලබා ඇති බව සනාථ කිරීම සඳහා එම ආයතනය විසින් ප්‍රදානය කරන ලද වලංගු සහතිකය ලබා තිබිය යුතුයි.

iii. වෘත්තීය සුදුසුකම්
අදාළ ක්ෂේත්‍රයේ අත්දැකීම් ලබා තිබීම අමතර සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

**03. වයස :**

අයදුම්පත් භාරගන්නා අවසාන දිනට අයදුම්කරුගේ වයස අවුරුදු 21 ට නොඅඩු හා වයස අවුරුදු 45 ට නොවැඩි විය යුතුයි.

**04. වැටුප් පරිමාණය :**

මාසික වැටුප රුපියල් 62,500.00 වේ.

**05. බඳවා ගන්නා ක්‍රමවේදය :**

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී අයදුම්කරු ලබාගන්නා සම්පූර්ණ ලකුණු ප්‍රමාණයෙන් ඉහළම ලකුණු අනුපිළිවෙළ (Merit Order) සැලකිල්ලට ගනු ලැබේ.

අයදුම්කරුවන් තම තොරතුරු ඇතුළත් අයදුම්පත්‍රය **"ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත, අංක : 393/48, කෝවිල් වීදිය, නල්ලූර්, යාපනය"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් 02.02.2021 වන දිනට ප්‍රථම ලැබෙන පරිදි තැපැල් කළ යුතුයි.

**එස්. තිරුවාකරන්**
**ලේකම්,**
**රාජ්‍ය සේවා කොමිෂන් සභාව,**
**උතුරු පළාත.**

**20.01.2021**